**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර තිබුණු අතර එසේ ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම 2021 දෙසැම්බර් 31 දිනට රු.78,184,784,968 ක් විය. තවද මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් අරමුදල විසින් සිදුකර නොතිබුණි. | 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවාගැනීම් සිදුනොකරන අතර, ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක කළ හැකි නව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කර ඇත. පැරණි යෝජනා ක්‍රමයේ ගෙවීම් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් වාර්ෂිකව ගෙවීම් කරනු ලබන අතර, නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආයුගණක තක්සේරුව ලබාගන්නා අවස්ථාවේදී පැරණි යෝජනා ක්‍රමයේද ආයුගණක තක්සේරුව ලබාගැනීම සිදුකරනු ඇත. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සක්‍රීය දායකයින්ගෙන් ගිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බැඳුන දිනය සහ හිමිකම්පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාම | පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුළින් ලබාගැනීමට අපහසු වී ඇත. මෙම තත්ත්වය හමුවේ පසු වාරික ස්වයංක්‍රීයව පරිගණක ගත කිරීම සඳහා රාජ්‍ය වාණිජ බැංකු මඟින් පසු වාරික අයකර එම වාරික අප දත්ත පද්ධතියට | දායකයින්ගේ නාම ලේඛනය සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර දායක |

| | | |
|---|---|---|
| ලේඛනය සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම උපචිත පදනම වෙනුවට මුදල් පදනමට රු.112,139,246 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | සම්බන්ධ කරගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | මුදල් උපචිත පදනමට ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) පෙර වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වලින් ගොවීන් වෙත නොගෙවූ රු.107,929 ක් සමාලෝචිත වර්ෂයේ ආපසු පොත් වලට ගැනීමේදී තැපැල් කාර්යාල ගිණුමට හර කර ගෙවිය යුතු ගොවි විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම වෙනුවට සදොස් ලෙස වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වියදම් ගිණුමට බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | මණ්ඩලය වෙත ලැබිය යුතු, නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් තැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගණකාධිකාරීවරයාගේ සනාථ කිරීම් මත පෙර වර්ෂයේදී ගිණුම් ගත කර ඇති අතර, 2021 වර්ෂය තුළ මුදල් ලැබීමේදී පෙර වර්ෂයේ සනාථ නොකළ රු.107,929 ක මුදල් ලැබී ඇත. ඒ අනුව ගිණුම්ගත කළ ලැබිය යුතු ශේෂය එම මුදල් ප්‍රමාණයෙන් අඩුවී ඇත. ලැබුණු මුදල්, ලැබිය යුතු නොගෙවූ විශ්‍රාම වැටුප් ගිණුමට (තැපැල් කාර්යාල) බැර කර අතිරික්තය ගොවි විශ්‍රාම වැටුප් වියදමට ගිණුම් තබා ඇත. | නොගෙවූ ගොවි විශ්‍රාම වැටුප් වියදම් ගිණුමට බැර නොකර ගෙවිය යුතු ගොවි විශ්‍රාම වැටුප් ගිණුමට බැර කළ යුතුය. |

### 1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට රු.81,967,040,765 ක ඍණ ශේෂයක් ගෙන තිබුණු අතර ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් රු.4,779,128,996 ක් වී තිබුණි. 2020 හා 2021 වර්ෂවලදී ගොවීන්ගේ දායකත්වය පිළිවෙලින් රු.19,316,409 ක් හා රු.15,746,696 ක් වූ අතර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු.4,502,560,108 හා රු.3,719,165,280 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.4,450,949,000 ක් සහ රු.3,753,000,000 ක් භාණ්ඩාගාරය මඟින් ලැබී තිබුණු අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂය තුළදී පුද්ගලයින් 161 දෙනෙකුට හිමි ශුද්ධ වාරික ගෙවීම්, ඊට අදාළ පොලිය, බෙලහීන ගෙවීම් සහ මරණ | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල, කාලය ඉකුත් වූ විට එම චෙක්පත් ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාලය හරහා | හිමිකම් නොපාන බව තහවුරු කර ගෙන පසුව |

| | | |
|---|---|---|
| පාරිතෝෂික මුදල් සඳහා ලියන ලද රු.1,304,300 ක් වූ චෙක්පත් 161 ක් ආදායකයින් හිමිකම් නොපාන බව තහවුරු කර නොගෙන ආදායමට ගෙන තිබුණි. | ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. කාලය ඉකුත්වන චෙක්පත් ලේඛනගත කර තබන අතර දායකයා විසින් හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවලදී අදාළ දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශ අනුව නැවත ආදායකයා වෙත චෙක්පත් නිකුත් කරනු ලබයි. | ආදායමට ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් වටිනාකම රු.3,719,165,280 ක් වූ අතර එම වටිනාකමින් ගොවීන් විසින් හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාණය රු.125,633,943 ක් විය. සිදුව ඇති අඩුපාඩු නිවැරදි කර එම ප්‍රමාණය විශ්‍රාම වැටුප් හිමිකරුවන්ට ලබා දීමට ක්‍රියා කර නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ගොවීන් විසින් ලබානොගන්නා අවස්ථාවලදී මණ්ඩලය වෙත නැවත ලබාගැනීමට කටයුතු කරනු ලබන අතර, එසේ ලබාගන්නා ගොවි විශ්‍රාම වැටුප් දායකයින් මියයාම වැනි අවස්ථාවලදී හා මාස 06 ක් පමණ ප්‍රතිලාභ ලබා නොගන්නා ප්‍රතිලාභීන්ගේ නම් නාම ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | එළඹෙන මාසයේ දී හෝ ගොවීන් විසින් ලබා නොගන්නා විශ්‍රාම වැටුප්, හිමිකරුවන්ට ලබා දීමට ක්‍රියා කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| (i) 6(1) වගන්තිය | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට සාමාජිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවත්, විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබුණි. එම කාල පරාසය තුළ ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් සඳහා ප්‍රතිපාදනයන් සිදු කර තිබුණද ගොවීන්ට ගෙවීම් නොකර 2012 වර්ෂයේ සිට රු.3,835,146,157 ක් වූ හිඟ විශ්‍රාම වැටුප මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතී. | විශ්‍රාම වැටුප් ලැබීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටි 20,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් කඩිනමින් විශ්‍රාම වැටුප් ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගන්නා ලද නිසා පොරොත්තු ලේඛනයේ සිටි ගොවීන් විශාල සංඛ්‍යාවකට විශ්‍රාම වැටුප් ගෙවීමට හැකියාව ලැබී ඇත. ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛනයට ඇතුළත් කර ගෙවිය යුතුව පවතින විශ්‍රාම වැටුප් ඉදිරියේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන ගෙවීමට නියමිතය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |
| (ii)15(2)වන සහ (3)වන වගන්ති | ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක අභියාචනයක් කිරීම සඳහා ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම් අවස්තා කොපමණද යන්න ගණනය කිරීමට හැකි පරිදි යෝජනා ක්‍රමය විසින් තොරතුරු | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව ඔවුන් යෝජනා ක්‍රමයට දායක වන අවස්ථාවේදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන අතර, ඔවුන් වෙත ලබාදෙන වාරික | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුය. |

| | | | |
| --- | --- | --- | --- |
| | පවත්වාගෙන ගොස් නොතිබුණු නිසා ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථා පිළිබඳ ගොවීන් වෙත දැන්වීම් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් පුද්ගලයින් 1127 ක් දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. | මුදල් සටහන් පොතේ සහ සහතික ඔප්පුවෙහි ඒ පිළිබඳව පැහැදිලිව සටහන් කර ඇත. එසේ දායකත්වය අවලංගු වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී පොලියද සමගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (iii) 27(1) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබා නොගෙන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයෙන් ණය මුදල් ලබාගෙන තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට එලෙස ලබාගෙන තිබුණු ණය මුදලේ ශේෂය පිළිවෙලින් රු.248,129,566 ක් සහ රු.546,031,197 ක් විය. | 2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එම යෝජනා ක්‍රමයේ මුදල් නොමැති වීම නිසා මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තුළින් මුදල් ලබාගෙන ගෙවීම් සිදුකර ඇත. මෙම ණය මුදල් ක්‍රමිකව ප්‍රතිපූරණය කරනු ලැබේ. | විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනා ක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.249,530,974 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.67,897,112 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.181,633,862 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන පසුගිය වසරට සාපේක්ෂව රු.197,000,000 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයින්ගේ ජීව දත්ත පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය සකස් කිරීමට සහ දිස්ත්‍රික් මට්ටමින් සමීක්ෂණ කටයුතු සිදුකර දත්ත ඇතුළත් කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය වෙනුවෙන් රු.5,640,925 ක් 2017 අගෝස්තු 11 දින වන විට වියදම් කර තිබුණි. 2022 මැයි මස වන විටද දිස්ත්‍රික්ක 14 ක සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණු අතර ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම නිසා අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩු අගයක් ගත්ත ද ලැබී ඇති තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. මෙම සමීක්ෂණය සඳහා ගොවීන්ගේ ප්‍රතිචාර දැක්වීම අවම අගයක් ගත් බැවින් සමීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදුකිරීම නවතා දමන ලදී. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීම කළ යුතුය. |
| (ආ) ගොවි විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සහ පරිපාලන වියදම් සඳහා මාසිකව මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදෙන අතර එසේ තිබියදී ගොවීන් වෙත බෙලහීන ගෙවීම් සහ මරණ පාරිතෝෂික ගෙවීම සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය තුළ වාර්ෂිකව වාරික මුදලක් තැන්පත් කරමින් ගොවීන් රක්ෂණය කර, රක්ෂණ අරමුදලක් ගොඩනගා ඇත. 2021 වර්ෂය අවසානයට එම අරමුදලෙහි වටිනාකම රු.1,146,766,067 ක් වූ අතර 2021 වර්ෂය සඳහා වාරික මුදල රු.17,737,354 ක් සහ වර්ෂය තුළ බෙලහීන ගෙවීම් සහ මරණ පාරිතෝෂික ගෙවීම් රු.1,011,630 ක් විය. මෙම රක්ෂණය පවත්වාගෙන යාමෙහි ඵලදායීතාවය අධ්‍යයනය කිරීමකින් තොරව අඛණ්ඩව එය සිදු කරනු ලබන බව නිරීක්ෂණය කෙරේ. | ගොවි විශ්‍රාම දායකයින් වෙත මරණ බෙලහීන පාරිතෝෂික ගෙවීම සඳහා මෙම අරමුදල ආරම්භයේදී වෙනත් රක්ෂණ ආයතන මගින් ක්‍රියාත්මක කරඇති අතර, වර්තමානයේ මණ්ඩලය තුළ ඇති කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය තුළින් එක් ගොවියෙකු සඳහා රු.60 ක වාර්ෂික දායකත්වයක් තුළින් මෙම අරමුදල සකස් කර ඇත. ගොවි විශ්‍රාම ලැබීමට පෙර දායකයාට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල අවශ්‍ය වේ. මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදෙනු ලබන්නේ විශ්‍රාම වැටුප් ගෙවීමට හා මෙහෙයුම් හා පරිපාලන වියදම් සඳහා පමණි. | රක්ෂණය පවත්වාගෙන යාමෙහි ඵලදායීතාවය අධ්‍යයනය කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදල වෙත පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට ලද රු.247,000,000 න් සමාලෝචිත වර්ෂයේ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් රු.209,734,912 ක් දරා ඉතිරි රු.37,365,088 ක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදල සඳහා යොදාගෙන නොතිබුණු අතර කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.199,551 ක් පමණක් තිබීම නිසා | 2021 වර්ෂයේ පරිපාලන හා මෙහෙයුම් වියදම් සඳහා ලද රුපියල් මිලියන 247 ක සම්පූර්ණ මුදල ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ගිණුම්ගත කර ඇති අතර, එය මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය හා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අතර පවතින ජංගම ගිණුම තුළින් ගිණුම් තබා ඇත. වර්ෂය තුළදී සිදුවන සමහර ගනුදෙනු මණ්ඩලයේ ප්‍රධාන යෝජනා ක්‍රමය වන කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය තුළින් සිදුකර එම යෝජනා ක්‍රමයට අදාළ වියදම් ඉහත කී ජංගම | භාණ්ඩාගාරයෙන් ලද මුදල් වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර නොගත යුතුය. |

| | | |
|---|---|---|
| එම මුදල් වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය. | ගිණුම මගින් ගැලපීම සිදුකරයි. ඒ අනුව ලද සියලු මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂයන් තුළ පවතී. | |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා අයදුම්පත් 6,478 ක් ගොවීන් විසින් ඉදිරිපත් කර තිබුණු අතර වර්ෂය තුළ ඉන් අයදුම්පත් 1,580 කට ප්‍රතිලාභ ලබා දීමට යෝජනා ක්‍රමය අපොහොසත්ව තිබුණි. | මෙම ගෙවීම් කඩිනමින් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ගොවි ජනතාව වෙත කඩිනමින් ප්‍රතිලාභ ලබාදිය යුතුය. |